<u>මහනුවර මහා නගර සභාව සඳහා ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත</u>
<u>තාක්ෂණ නිලධාරි (සිවිල්) සේවය ලබාගැනීම</u>

මහනුවර මහා නගර සභාවේ සේවා අවශ්‍යතාවය මත ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත තාක්ෂණ නිලධාරි (සිවිල්) සේවය ලබා ගැනීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව අයදුම්පත් බහාලන කවරයෙහි වම්පස ඉහල කෙළවරෙහි සපයනු ලබන සේවාවේ නාමය සඳහන් කර 2026.05.29 දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, මහනුවර මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

| | | |
|---|---|---|
| 1. | තනතුරු සංඛ්‍යාව | : තනතුරු 02 |
| 2. | වයස | : සියළුම අයදුම්කරුවන් අයදුම්පත් ඉදිරිපත් කරන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. |
| 3. | මාසික දීමනාව | : මාසික දීමනාව රු. 70,050/-කි. (මාසයකට අවම දින 25ක් රාජකාරි කළ යුතුය) |
| 4. | අධ්‍යාපන සුදුසුකම් | : ක්ෂේත්‍රයට අදාල විෂයයන් දෙකක් සහිතව විද්‍යා /ගණිත / තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් අ.පො.ස. (උ.පෙළ) විභාගය එකවර සමත්වීම<br>සහ<br>සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම |
| 5. | වෘත්තීය සුදුසුකම් | : මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව සමඟ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාලව වසර 5ක පළපුරුද්ද<br>හෝ<br>ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලේමාව සමඟ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාලව වසර 5ක පළපුරුද්ද<br>හෝ<br>අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව සමඟ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාලව වසර 5ක පළපුරුද්ද<br>හෝ<br>ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව සමඟ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාලව වසර 5ක පළපුරුද්ද<br>හෝ<br>තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම සමඟ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාලව වසර 10ක පළපුරුද්ද |

සහ

රැකියා ක්ෂේත්‍රයට අදාලව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් හෝ ජාතික වෘත්තීය කුසලතා (NVQ) 05 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම

6. තෝරා ගැනීමේ ක්‍රමය : අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයවළුන් අතරින් බඳවා ගැනීමට අවශ්‍ය මූලික සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, අවශ්‍ය සියලුම සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව නිසි සුදුසුකම් සහිත අයදුම්කරුවන් තෝරාගෙන ඔවුන් ලබාගත් ලකුණු ප්‍රමුඛතාවය අනුව බඳවා ගනු ලැබේ.

සේවාව සපයා ගැනීමට තෝරාගනු ලබන නිලධාරීන් පහත කොන්දේසි වලට යටත්ව සේවයේ යොදවා ගැනීම සිදු කරනු ලැබේ.

1. දිනකට අවම පැය 08 ක කාලයක් (සාමාන්‍ය රාජකාරි වේලාව තුල) සේවාව සැපයිය යුතුය.
2. පූර්ණ කාලීනව රාජකාරීන්හි නියැලිය යුතුය.
3. සේවයේ අවශ්‍යතාවය මත සෙනසුරාදා දිනයන්හි සේවයේ යෙදිය යුතු අතර සුවිශේෂී රාජකාරි සඳහා ඉරිදා හා රජයේ නිවාඩු දිනයන්හි සේවය සැපයීම සඳහා කැඳවනු ලැබිය හැක. එවන් අවස්ථාවන්හිදී උක්ත මාසික දීමනාවට යටත්ව සේවය සැපයීම සිදු කල යුතු වේ.
4. සේවා සැපයීමට අදාල අවු: 1 ක කාල සීමාවක් සඳහා සේවා ගිවිසුමකට ඇතුලත් විය යුතු අතර සේවා අවශ්‍යතාවය මත මෙම කාල සීමාව දීර්ඝ කරනු ලැබේ.

7. වෙනත් සුදුසුකම් :

- අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- බඳවා ගැනීම සඳහා වන සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
- කායික සුදුසුකම් : තනතුරේ රාජකාරි ඉටු කිරීමට සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.
- අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

- අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

සටහන :- මෙම සේවයේ යොදවා ගැනීම වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සියළු සුදුසුකම් සපුරා තිබිය යුතු අතර සේවය ලබා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුවේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවාගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම, මෙම නිවේදනය සංශෝධනය කිරීම සම්බන්ධ පූර්ණ අයිතිය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

2026.05.15

ඒ.එච්.එම්. ඉන්දිකා කුමාරි අබේසිංහ
නාගරික කොමසාරිස්
මහනුවර මහා නගර සභාව

## ආදර්ශ අයදුම්පත්‍රය
## මහනුවර මහා නගර සභාව සඳහා ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත
## තාක්ෂණ නිලධාරි (සිවිල්) සේවය ලබාගැනීම

01. අයදුම්කරු අයත්වන පළාත් පාලන ආයතනය: ..........................................................................

02. (අ) මුලකුරු සමඟ නම (සිංහලෙන්) : ..........................................................................
(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්): ..........................................................................
(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්): ......................................................................

03. ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

04. උපන්දිනය :- වර්ෂය : ...................මාසය: ................... දිනය: ...................

05. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට (2026.05.29 දිනට) වයස: අවුරුදු ....... මාස..... දින.......

06. ස්ත්‍රී පුරුෂ භාවය : ..........................................................................

07. විවාහක / අවිවාහක භාවය : ..........................................................................

08. ස්ථිර ලිපිනය : ..........................................................................

09. දුරකථන අංකය : ..........................................................................

10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? : ..........................................................................

එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචියෙන්ද? යන බව ..........................................................

11. අධ්‍යාපන සුදුසුකම්

11. (I) අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය

වර්ෂය : ...................
විභාග අංකය : ...................

| අනු අංකය | විෂයය | ලබා ඇති ශ්‍රේණිය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |
| 10 | | |

11. (II) අ.පො.ස. (උසස් පෙළ) විභාගය

වර්ෂය : ...................
විභාග අංකය : ...................

| අනු අංකය | විෂයය | ලබා ඇති ශ්‍රේණිය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

11. ඩිප්ලෝමා හෝ වෙනත් උසස් අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ තොරතුරු

......................................................................................................................................

......................................................................................................................................

12.වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද :

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

13.අයදුම්කරුගේ සහතිකය:

මා විසින් ඉහතින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. ඉහත තොරතුරු කිසිවක් අසත්‍ය බව මා මෙම තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා පත්කිරීම සඳහා නුසුදුස්සකු වන බවත්, තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා වහාම සේවයෙන් පහ කිරීමට යටත්වන බවත් පැහැදිලිව දනිමි.

.........................

දිනය :........................ අයදුම්කරුගේ අත්සන